**නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව - 2019**
**---------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකගේ වගකීම

---------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විශ්වවිද්‍යාලයේ පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ අයිතම 20කට අදාළව පිරිවැය රු. 468,015,255ක් වූ අතර, එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - 7 හි 42(ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර නොමැත. එමෙන්ම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - 3 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල එම වත්කම් සාධාරණ අගයට දැක්වීමේ අවශ්‍යතාවය අනුව එම වත්කම්වල ඵලදායී ආයු කාලය ඇසතමේන්තු කිරීමේ දෝෂය නිවැරදි කර නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වත්කම් නැවත අගය කිරීමට පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළ යුතුවේ. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයනහි 72 වගන්තිය අනුව, ඉඩම් හා ගොඩනැගිලි එක්වර අත්පත් කරගන්නා අවස්ථාවන්හිදීද වෙන් වෙන්ව ගිණුම්ගත කළ යුතුවේ. | ඉඩමක අයිතිය ලබාගැනීමට හා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයට අයත් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට අදාළ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරමින් පවතී. එම | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළ යුතුවේ. |

| | |
|---|---|
| කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයේදී වටිනාකම රු. මිලියන 1,707ක් වූ විශ්වවිද්‍යාලයේ ඉඩම් හා ගොඩනැගිලි අගය මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත නොකොට සමස්ත අගයක් ලෙස දක්වා ඇත. | ක්‍රියාවලිය අවසන් වූ පසු ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කළ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ දේපල, පිරියත හා උපකරණවලින් කොටසක් ක්ෂය කිරීමේ වියදම රු. 14,704,390 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම වත්කම් සඳහා ක්ෂය වියදම ලෙස රු. 64,735,341 ක් දක්වා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා වූ හිඟය රු. 50,030,095කින් වැඩිවී ඇත. | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් සඳහා ඌන ක්ෂය ගණනය නිවැරදි කිරීම මෙයට හේතු වී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 649 අනුව, මෙම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය වර්ෂ 10 කි. එනම්, වාර්ෂික ක්ෂය අනුපාතය සියයට දහයකි. වර්ෂ 10කට වඩා වැඩි අයිතම ඌන ක්ෂය කර ඇති බැවින් ඒ සඳහා නිවැරදිකිරීම් සිදුකර ඇත. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති රු. 526,283,741ක් වූ මුදල් හා මුදල් සමාන දෑ අතරින්, රු. 3,048,236ක වටිනාකමකින් යුත් මුදල් හා මුදල් සමාන දෑ වලට අදාළ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත. | මෙම ශේෂයන් 2011 වර්ෂයේ සිට නිපුණතා අධිකාරිය (කවුන්සිලය වෙනුවට) විසින් බැංකු ගිණුම් 11ක් වසා දැමීම හේතුවෙන් ඉදිරියට ගෙන එන ලද ශේෂයන්ය. ස්ථාන කීපයක විවිධ ක්‍රියාකාරකම් සඳහා බැංකු ගිණුම් එකොළහක් ක්‍රියාත්මක වූ අතර, පාලනය හා විනිවිදභාවය වැඩි කිරීම සඳහා සියලු ගිණුම් එක් ගිණුමකට මාරු කරන ලෙස නිපුණතා අධිකාරිය විසින් ඉල්ලීමක් කරන ලදී. මුදල් පොත් යාවත්කාලීන කිරීමට තීරණය කර තිබුණද, ලේඛන සොයාගත නොහැකිවීම නිසා මුදල් | මූල්‍ය ප්‍රකාශනවල අතිරික්ත වටිනාකම නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පොත යාවත්කාලීන කිරීමට නොහැකි විය. දීර්ඝ කාලීන ගිණුම්කරණ ඌනතාවයන් සම්බන්ධ කරුණු සොයාබැලීම සඳහා ලේඛකාධිකාරී විසින් පත්කරන ලද කමිටුව සමඟ සාකච්ඡා කර මෙම අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | |
| (ඇ) | විවිධ පාර්ශවයන් විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව ගොනුකර ඇති නඩු 13ක් සඳහා හිමිකම්පෑමේ වන්දි ලෙස වටිනාකම රු. 504,574,803ක් වූ වෙන් කිරීමක් කර ඇතත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත - 8 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අඛණ්ඩ වගකීම යටතේ ඒ පිළිබඳ අනාවරණය කර නොමැත. | ප්‍රමිතය අනුව ඒ සම්බන්ධයෙන් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළ යුතුවේ. |

## 1.6 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති ,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව 2020 ජුනි 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | බොහෝ දුරට නියමිත කාලය තුළ වැඩ කටයුතු අවසන් කර ඇති අතර, කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රමාදයක් සිදුවුවද, මේ වන විට එම කටයුතු අවසන් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ xx වන පරිච්ඡේදයේ 3 (1) වගන්තිය සහ 2017 ජුලි 10 දිනැති අංක 10/2017 දරන චක්‍රලේඛ ලිපි | සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට රු. මිලියන 748ක වැටුප් ගෙවා ඇති අතර, ඔවුන්ගේ පැමිණීම සහ පිටවීම තහවුරු කර නොතිබුණි. | අනෙකුත් සියලුම විශ්වවිද්‍යාල මෙන් සාම්ප්‍රදායික ක්‍රමයට ඔවුන්ගේ පැමිණීම සටහන් නොකරයි. කෙසේවෙතත්, එක් එක් දෙපාර්තමේන්තුවට අදාළව වෙන වෙනම පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ. | ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පැමිණීම සහ පිටවීම සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2015 නොවැම්බර් 17 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතනික චක්‍රලේඛ අංක 15/2015 | අභ්‍යන්තර සිසුන් සඳහා පවත්වනු ලබන විභාගවල ප්‍රතිඵල මාස 03 කාලයක් තුළ නිකුත් කළ යුතුය. කෙසේවෙතත්, අධ්‍යයන වර්ෂ 2014/2015 සිට 2017/2018 දක්වා පවත්වන ලද විභාගවල ප්‍රතිඵල මාස 01 සිට මාස 10ක් දක්වා කාලයක ප්‍රමාදයකින් පසු නිකුත් කර තිබුණි. මෙය ශිෂ්‍ය රැකියා අවස්ථාවන්ට බලපානු ලැබේ. | වැඩසටහන සමාලෝචනය කරන අතර, බාහිර පරීක්ෂකයන් විසින් නැවත ඇගයීම සිදුකිරීමෙන් තත්ත්ව සහතිකකරණය වැඩිදියුණු කෙරේ. ප්‍රමාදයට ප්‍රධාන හේතුව වන්නේ මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට කටයුතු කිරීමයි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842. | වටිනාකම රු. 4,309,751,059ක් වූ ස්ථාවර වත්කම්වලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. | නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම්වලට අදාළ පරිගණකගත මෘදුකාංග ක්‍රමයක් පවතින අතර, අවශ්‍ය තොරතුරු එම පද්ධතිය තුළින් ලබාගත හැක. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විස්තරාත්මක ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ඉ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. පීඊඩී/12 හි 6.5.1 වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතෙහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.345,563,842 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 334,815,279 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,748,563 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පාරිතෝෂිත දීමනා සඳහා වෙන්කිරීමේ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවණතා විශ්ලේෂණය

පෙර වර්ෂය සමඟ සැසඳීමේදී, සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්තන ප්‍රදානයන් සහ අනෙකුත් ආදායම් වැනි විශ්වවිද්‍යාල ආදායම් ප්‍රභවයන් සියයට 20ක ප්‍රතිශතයකින් වැඩිවී තිබුණි. පාරිතෝෂික දීමනා ගණනය කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය අනුව අධ්‍යයන දීමනා පදනම්ව පාරිතෝෂික දීමනා ගණනය කිරිම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව පාරිතෝෂික දීමනා සියයට 514ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර, ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය සියයට 69කින් වැඩිවීම ඉහත අඛණ්ඩ පිරිහීමට හේතු වී තිබේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ත්‍රස්තවාදී ගැටුම් හේතුවෙන් 2004 වර්ෂයේදී මියගිය කථිකාචාර්යවරයාගේ යැපෙන්නන්ට 2004 වර්ෂයේ සිට 2020 ජූලි මස දක්වා කථිකාචාර්යවරුන්ට අධ්‍යයන දීමනා ගෙවීමේ අපේක්ෂිත අරමුණු නොසලකා 1988 ජූලි 13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88 මත පදනම්ව එකතුව රු. 8,640,688ක ගෙවීමක් කර තිබුණි. | 1988.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව හා පසුව කරන ලද සංශෝධනයන් අනුව, නිලධාරියා විශ්‍රාම යන වයස සම්පූර්ණ වන තෙක් නිලධාරියාට ලැබිය යුතු වැටුප සහ වෙනත් දීමනා මියගිය සේවකයාගේ යැපෙන්නන්ට ගෙවිය යුතු වේ. ඉහත ප්‍රතිපාදන අනුව 2004 වර්ෂයේදී මියගිය නිලධාරියාගේ යැපෙන්නන්ට වැටුප් හා දිමනා ගෙවා ඇත. | අධ්‍යයන දීමනා ගෙවීමට අදාළ අරමුණු සාක්ෂාත් කරගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කාර්ය මණ්ඩලයේ 200ක් අතරින් පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ වී ඇත්තේ 24 දෙනෙක් පමණි. එසේ වුවද, පර්යේෂණ කමිටුව විසින් පර්යේෂණ 11ක් අනුමත කර ඇති අතර, ඒ සඳහා වන ප්‍රදානයන්ද අනුමත කර ඇත. කෙසේ වෙතත්, සැලසුම් කර තිබූ පරිදි පර්යේෂණ ව්‍යාපෘති දෙකක් පමණක් සම්පූර්ණ කර ඇති අතර, පර්යේෂණ සඳහා වෙන් කරන ලද මුළු ප්‍රදානයන් රු. 11,244,372 න් රු. 6,851,466 ක් හෙවත් සියයට 58ක් පමණක් උපයෝජනය කර ඇත. | පර්යේෂණ ප්‍රදානයන්ගේ ප්‍රගතිය සම්බන්ධයෙන් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේදී අධීක්ෂණය කරනු ලබන අතර, පර්යේෂණ රාමුව තුළ සාධාරණ හේතූන් පිළිබඳ සලකා බලා ප්‍රදානයන්ගේ කාලසීමාව දීර්ඝ කරනු ලැබේ. පවත්නා ප්‍රදානයන් සැපයීමේ නිර්ණායක, ප්‍රගතිය අධීක්ෂණය සහ අවසාන නිමවුම ඇගයීමේ ඇති දුර්වලතා නිවැරදි කිරීම සඳහා නව පර්යේෂණ ප්‍රතිපත්තියක් සෙනෙට් සභාවට ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුස්තකාලය ස්වයංක්‍රීයව පවත්වාගෙන යාම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලද එකතුව රු. 4,500,000ක මුදලක් වසර 5කට වැඩි කාලයක් තුළ අපේක්ෂිත අරමුණු සඳහා යොදාගෙන නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතයන්හි හඳුනාගැනීමේ නිර්ණායකයන්ට අනුව, එය ප්‍රදානයක් ලෙස හඳුනාගෙන ඇති අතර, විලම්බිත ආදායමක් ලෙස පෙන්නුම් කර ඇත. එම ප්‍රදානයන් උපයෝජනය කර තිබුණද, ප්‍රදානයන් සඳහා ක්‍රමක්ෂය කිරීමේ ගිණුම්කරණ ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි. එම නිසා, ගිණුම් පොත්වල ඇති ශේෂය, සියලු ප්‍රදානයන් සංචිත කර ඇති බව වෙන වෙනම හඳුනාගත් පසුව ප්‍රදානයෙන් සිදුකරන වියදම ක්‍රමක්ෂය කිරීමට පියවර ගනු ලැබේ. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රදානයන් ක්‍රමක්ෂය කිරීමට පියවර ගත යුතුය. |

**3.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෘෂිකර්ම පීඨය වෙත ලබාදී තිබූ රු. මිලියන 20ක් වටිනා අභිජනන යන්ත්‍රයක්, රෝද දෙකේ ට්‍රැක්ටරයක්, මුද්‍රණ යන්ත්‍රයක් සහ ජංගම විද්‍යාගාරයක් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතා නොකිරීම නිසා නිෂ්ක්‍රීයව පැවතුණි. | හංවතුර හේතුවෙන් අභිජනන ඒකකයට හානි සිදුව ඇති අතර, එම උපකරණ බැහැර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. මුද්‍රණ යන්ත්‍රයේ පවතින දෝෂ හේතුවෙන් භාවිතා කළ නොහැකි තත්ත්වයක පවතී. AHEAD ව්‍යාපෘති ප්‍රදානයන් යටතේ විද්‍යා පීඨය මඟින් ප්‍රතිසංස්කරණය කිරීමට නියමිත ජංගම විද්‍යාගාරය පර්යේෂණ හා ප්‍රජා කටයුතු සඳහා යොදගැනීමට බලාපොරොත්තු වේ. ඉංජිනේරු වැඩමුළු ඉගැන්වීම් කටයුතු සඳහා රෝද දෙකේ ට්‍රැක්ටරය දැනටමත් භාවිත කරයි. | ප්‍රමාදයකින් තොරව මෙම ගැටලු විසඳීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අනුමත සේවකයන් 284ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 217ක් විය. මේ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 67ක් වූ අතර, ඒ අතර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්ගේ පුරප්පාඩු 14ක් පැවතුණි. අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 93ක් විය. මෙම තත්ත්වය සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා බලපා ඇතත්, 2020 ජූලි 27 දින වන විටත් විශ්වවිද්‍යාලය විසින් මෙම පුරප්පාඩු පිරවීම සිදුකර නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් අවස්ථා ගණනාවකදී අධ්‍යයන තනතුරු සඳහා දැන්වීම් පළකිරීමට කටයුතු කර ඇත. 2006.06.06 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 876 අනුව, සුළු සේවක ශ්‍රේණි සඳහා බාහිර බඳවාගැනීම් සහ තනතුරු 14ක් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් යෙ ාමු කෙරෙන අපේක්ෂක ලැයිස්තුවකින් බඳවාගැනීම් සිදුකළ යුතුවේ. 2019 වර්ෂයේදී රජය විසින් කිහිප අවස්ථාවකදී වෙනස් කරමින් පත්කරන ලද උසස් අධ්‍යාපන අමාත්‍යවරුන් විසින් එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අපේක්‍ෂකයන්ගේ ලැයිස්තුව අත්හිටුවන ලදී. | ප්‍රමාදයකින් තොරව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |